

වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2022

வருடாந்த செயற்றிறன் அறிக்கை - 2022

Annual Performance Report of the Year - 2022

ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව

கருத்திட்ட முகாமைத்துவம் மற்றும் கண்காணிப்புத் திணைக்களம்

Department of Project Management and Monitoring

වැය ශීර්ෂ අංක 280

செலவினத் தலைப்பு : 280

Expenditure Head No: 280

2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංක 280

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

03 පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශකය

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

06 පරිච්ඡේදය- මානව සම්පත් පැතිකඩ

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / විධායක සාරාංශය

1.1 හැඳින්වීම

කඩිනම් සංවර්ධන ප්‍රයත්නයන්ට සමගාමීව සහ රාජ්‍ය ආයෝජන උපායමාර්ගයන්ට අනුකූලව දිවයින පුරා ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් වලින් අපේක්ෂිත ප්‍රතිඵල එකඟවූ පිරිවැය හා කාලරාමුව තුළ සාක්ෂාත් කර ගැනීම සඳහා සුවිශේෂ අවධානයක් යොමු කිරීම අවශ්‍යවේ. එබැවින්, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන අවහිරතා ඉවත් කිරීම සම්බන්ධයෙන් නිසිකල්හි තාර්කික හා දැනුවත් තීරණ ගැනීමට හැකිවන පරිදි එම ව්‍යාපෘති හා වැඩසටහන්වල ප්‍රගතිය අදාළ පාර්ශවයන් වෙත වාර්තා කිරීම මෙන්ම පහසුකම් සැලසීම කළ යුතුවේ. එබැවින්, සම්පත් කාර්යක්ෂමව සහ ප්‍රශස්තව රාජ්‍ය ආයෝජනයෙහි යෙදවීම සහතික කරනු වස් රාජ්‍ය මුල්‍ය කළමනාකරණයේදී ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ ක්‍රියාවලීන් වඩා වැදගත්වී තිබේ. මෙම මුඛ්‍ය අරමුණ ඉටුකර ගැනීම පිණිස ව්‍යාපෘති සුමටව සහ කඩිනමින් ක්‍රියාත්මක කිරීමට අදාළ අධීක්ෂණය, උපදේශනය හා පහසුකම් සැලසීම ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබයි.

1.2 ආයතනයේ දැක්ම මෙහෙවර සහ අරමුණු

දැක්ම

සඵලදායී සංවර්ධනයක් කරා

මෙහෙවර

අපේක්ෂිත සංවර්ධන ප්‍රතිඵල ජනනය සහතික කරනුවස් සියලුම සංවර්ධන ව්‍යාපෘතීන් අධීක්ෂණය, ඇගයීම සහ පහසුකම් සැලසීම මෙන්ම ක්‍රියාත්මක කරනු ලබන ආයතන වෙත උපදේශනය ලබාදීම.

අරමුණු

සම්පත් ප්‍රශස්ථ ලෙස භාවිතා කිරීම තුළින් එකඟ වූ කාලරාමුව සහ පිරිවැය තුළ අපේක්ෂිත සංවර්ධන ප්‍රතිඵල ජනනය ඉහළ නැංවීම.

1.3 ප්‍රධාන කාර්යයන්

1. දේශීය සහ විදේශීය මූල්‍යයනය යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන්හි තොරතුරු එක් රැස් කිරීම, විශ්ලේෂණය හා අධීක්ෂණය.
2. විශාල සහ මහා පරිමාණයේ ව්‍යාපෘති හා වැඩසටහන්හි කාර්යසාධනය කාර්තුමය වශයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කිරීම.
3. මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් වල ගැටළු නිරාකරණය
4. විදේශ මූල්‍යයනය යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සහ වැඩසටහන්හි ප්‍රගතිය සමාලෝචනය සඳහා සංවර්ධන පාර්ශවකරුවන් වෙත පහසුකම් සැලසීම.
5. තෝරාගත් විදේශ මූල්‍යයනය සහිත ව්‍යාපෘතින්හි ප්‍රතිඵල අත්පත් කරගැනීමේ ප්‍රගතිය සත්‍යාපනය කිරීම හා මූල්‍ය ආධාර සපයනු ලබන ආයතනවලට එම ණය වාරික නිදහස්කල හැකිවන පරිදි ව්‍යාපෘතිවල ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සහතික කිරීම.
6. ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැපයීම.
7. විවිධ පාර්ශවයන් විසින් කරනු ලබන ඉල්ලීම් මත පදනම්ව ව්‍යාපෘති ඇගයීම් සිදුකිරීම හා ඒ තුළින් සැලසුම් ක්‍රියාවලිය සඳහා නිර්දේශ ලබාදීම.
8. සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන්වල කාර්ය සාධන වාර්තා ප්‍රකාශයට පත්කිරීම තුළින් සංවර්ධන තොරතුරු බෙදා හැරීම.

1.4 සංවිධාන සටහන (ඇමුණුම - 1)

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

තාක්ෂණික අංශ 07 ක් සහ සහාය අංශ 03 කින් සමන්විත ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව, අධ්‍යක්ෂ ජනරාල් සහ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් පස් දෙනෙකුගේ සෘජු අධීක්ෂණය යටතේ පහත පරිදි ව්‍යුහගත වී ඇත.

තාක්ෂණික අංශ

i. කර්මාන්ත හා මූල්‍ය
ii. ජල සම්පාදන හා විදුලිබල
iii. කෘෂිකර්ම හා වාරිමාර්ග
iv. අධ්‍යාපන හා සෞඛ්‍ය
v. නාගරික පළාත් හා ප්‍රාදේශීය සංවර්ධන
vi. ප්‍රවාහන හා මහාමාර්ග
vii. රාජ්‍ය පරිපාලනය

සහාය අංශ

i. ආයතනික
ii. මුදල්
iii. පරිගණක තාක්ෂණ

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් අධීක්ෂණය හා වාර්තා කිරීම.

සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය, සමස්ථ වර්ෂය පුරාම දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මක වන එක් ප්‍රධාන කාර්යයක් වන අතර, එම ප්‍රගතිය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති තීරකයන් දැනුවත් කිරීම කාර්තුමය වශයෙන් සිදු කරනු ලැබේ. කොවිඩ් -19 වසංගත තත්ත්වය සමනය වෙමින් පැවතියද අර්බුදකාරී ආර්ථික තත්වයන් යටතේ නිර්මාණය වූ සංකීර්ණ ගැටළු හමුවේ 2022 වසරේ පැනනැගි ඉන්ධන හිඟය නිසා ඇතිවූ ප්‍රවාහන අපහසුතාවයන් මත මාර්ගගත ක්‍රමය අනුව නිවස්නව රාජකාරි සිදුකිරීම හේතුවෙන් 2022 වර්ෂයේදී ද, සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය දෙපාර්තමේන්තුවට අභියෝගාත්මක විය. එම අභියෝග මධ්‍යයේ වුවද දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂයට නියමිත ප්‍රගති අධීක්ෂණ කටයුතු සිදුකර ඒ සම්බන්ධ නිරීක්ෂණ ඇතුලත් පළමු, දෙවන, තෙවන හා සිවුවන කාර්තුවලට අදාළ ප්‍රගති වාර්තා හා අනෙකුත් වාර්තා සම්පිණ්ඩනය කර නිර්දේශයන් සමඟ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට සමත් විය.

2022 වර්ෂයේ දේශීය හා විදේශීය මූල්‍යයනය මත විවිධ රේඛීය අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වූ විශාල සහ මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති සංඛ්‍යාව 261 ක් වූ අතර, එයට විශාල පරිමාණ ව්‍යාපෘති 150 ක් හා මහා පරිමාණ ව්‍යාපෘති 111 ක් අයත් විය. මෙම ව්‍යාපෘති 261 අමාත්‍යාංශ 23 ක් මඟින් ක්‍රියාත්මක වූ අතර, එම අමාත්‍යාංශ වෙතින් මාසිකව ව්‍යාපෘති ක්‍රියාත්මක කරණයේ සංවර්ධන දත්ත ලබා ගැනීම සිදුකෙරේ. මෙම විශාල සහ මහා පරිමාණ ව්‍යාපෘති අතරින්, 138 ක් දේශීය අරමුදල් හා ණය මගින් සහ ව්‍යාපෘති 123 ක් විදේශීය ණය හා ප්‍රදාන මගින් මූල්‍යනය කර ඇත.

ද්විපාර්ශවික මූල්‍යාධාර සැපයුම්කරුවන් විසින් අරමුදල් සැපයීම තාවකාලිකව අත්හිටුවීම, ප්‍රාග්ධන අරමුදල් ප්‍රවාහය ජනතා මූලික අවශ්‍යතා සපුරාලීම අරමුණු කර ගනිමින් පුනරාවර්තන වියදම් වෙනුවෙන් යෙදවීමට සිදුවීම, දෛනික විදුලි කප්පාදුව, රට තුළ උද්ගත වූ විදේශ විනිමය අර්බුදය මත පැන නැගුණු ආනයන සීමාවීම් හා එමඟින් වූ අමුද්‍රව්‍ය හිඟතාවය, ඉන්ධන හිඟය මෙන්ම නිෂ්පාදන පිරිවැය ඉහළ යාම යනාදී අවහිරතාවයන් මධ්‍යයේ වුවද, 2022 සිවුවන කාර්තුව අවසන් වන විට නිමකිරීමට නියමිතව තිබූ ව්‍යාපෘති 109 ක් අතුරින් ව්‍යාපෘති 29 ක් පමණක් අවසන් ව්‍යාපෘති ප්‍රතිඵලය ජනනය කිරීමට සමත්ව තිබිණි. තවද, කාර්ය සාධන ගැටළු හේතුවෙන් මහා පරිමාණ ව්‍යාපෘති 29 ක් වර්ෂ අවසානය වන විට අත්හිටවූ බවට වාර්තා විය.

වගුව 2.1 : සමස්ථ පිරිවැය අනුව ව්‍යාපෘති වර්ගීකරණය

සමස්ථ පිරිවැය අනුව මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති වර්ගීකරණය						
ඇස්තමේන්තුගත ව්‍යාපෘති වටිනාකම (රු.මි.)	1000-15000	15001-30000	30001-45000	45001-60000	60000 ට වැඩි	එකතුව
ව්‍යාපෘති සංඛ්‍යාව	179	41	18	9	14	261
විදේශීය	66	29	15	5	8	123
දේශීය	113	12	3	4	6	138

ප්‍රගති අධීක්ෂණ කාර්යයේදී දත්ත රැස්කිරීමේ ප්‍රධාන මාධ්‍යයක්වූ දෙපාර්තමේන්තුවේ පිහිටුවා ඇති ජාතික සංවර්ධන තොරතුරු පද්ධතිය (NDIS) නව තාක්ෂණ යොදා ගනිමින් නවීකරණයට ගත් ක්‍රියාමාර්ග කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යය සාධනය හේතුවෙන් අතරමගදී අවසන් කිරීම නිසා 2022 වර්ෂයේ දී ද ව්‍යාපෘති සමාලෝචනය, වාර්තා කිරීම, සම්බන්ධීකරණය සහ ක්‍රියාත්මක කිරීමේදී

මතුවන ගැටළු අදාල පාර්ශවයන් සම්බන්ධ කර විසඳා දීම සඳහා විශේෂ ප්‍රයත්නයක් දැරීමට සිදු විය. මෙම තත්වය මඟ හරවා ගැනීම සඳහා ජාතික ඒකාබද්ධ සංවර්ධන තොරතුරු පද්ධතිය (INDIS) නැවත නවීකරණය කිරීමේ හැකියාව පිලිබඳව ජාත්‍යන්තර සංවර්ධනය සඳහා එක්සත් ජනපද නියෝජිතායතනය (USAID) සමග ද 2022 වසරේ දී සාකච්ඡා කරණු ලදී.

ප්‍රගති සමාලෝචන ක්‍රියාවලියේදී හඳුනාගත් සමහර ව්‍යාපෘතීන්හි පවත්නා ගැටළු විසඳීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතුව ඇත. එමනිසා ව්‍යාපෘතීන්හි සත්‍ය තත්ත්වය අනාවරණය කර ගැනීම පිණිස රේඛීය අමාත්‍යාංශ මඟින් ලබාදෙන මාසික හා කාර්තුමය වාර්තා සහ පාර්ශවකරුවන් සමඟ පවත්වන ව්‍යාපෘති කාර්යසාධන රැස්වීම් පමණක් ප්‍රමාණවත් නොවන අතර, ක්ෂේත්‍ර චාරිකා වල නිරත වීම තුළින් ලබා ගන්නා නිරීක්ෂණ බෙහෙවින් වැදගත්වේ. ඒ අනුව, මෙම දෙපාර්තමේන්තුව විසින් සෑම වර්ෂ ආරම්භයකදීම එකිනෙක අංශයන් යටතේ ක්ෂේත්‍ර චාරිකා සැලැස්ම පිළියෙල කරනු ලබයි. කෙසේ වුවද, රට මුහුණ දුන් ආර්ථික අර්බුදය හමුවේ 2022 වසරේ පැනනැඟි ඉන්ධන හිඟය නිසා ඇතිවූ ප්‍රවාහන අපහසුතායවයන් මත එම වර්ෂයට ඉලක්ක කරන ලද ක්ෂේත්‍ර චාරිකා වලින් හරි අඩකටත් වඩා අඩු ප්‍රමාණයක් පමණක් ආවරණය කිරීමට හැකිවිය. ඒ අනුව, සැලසුම් කරන ලද ක්ෂේත්‍ර චාරිකා 115 අතරින් සියලුම අංශ ආවරණය වන පරිදි ක්ෂේත්‍ර අධීක්ෂණ චාරිකා දොළහක් මඟින් ව්‍යාපෘති 30 ක්, නිරීක්ෂණය කරන ලදී.

එම ක්ෂේත්‍ර නිරීක්ෂණ, වාර්තා හා දත්ත අනුව සංවර්ධන ව්‍යාපෘති වල ගැටළු නිරාකරණය සඳහා දෙපාර්තමේන්තුව විසින් විශේෂ කාර්ය භාරයක් සිදු කරන ලදී. විශේෂයෙන්ම 2022 වර්ෂයේ පැවති අර්බුදකාරී ඇර්ථික තත්වය මත සංවර්ධන ව්‍යාපෘති වල පැන නැඟි ගැටළු මගහරවා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත මෙම දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ යෝජනාවක් මත ‘‘මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති නැවත ක්‍රමෝපායකරණය හා කඩිනම් කිරීමේ කමිටුව’’ යාන්ත්‍රණය ස්ථාපිත කරන ලද අතර, එමඟින් සාකච්ඡා වාර 16 ක් පවත්වා රේඛීය අමාත්‍යාංශ වල නිලධාරීන් සමග මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති සියල්ලම (260) පහත නිර්නායක අනුව සමාලෝචනය කර විසඳුම් ලබා දී ඇත.

- ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය 80%ට වඩා වැඩි නම් එම ව්‍යාපෘති තවදුරටත් ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව.
- ආර්ථිකයට ධනාත්මක බලපෑමක් කළහැකි හා කඩිනමින් ප්‍රතිලාභ අත්කර දියහැකි ප්‍රමුඛ ව්‍යාපෘති.
- ව්‍යාපෘතියෙහි එක් එක් ක්‍රියාකාරකම් අත් කරගෙන ඇති ප්‍රගතිය සහ ව්‍යාපෘතිය නිම කිරීමට එහි ඇති සම්බන්ධය.
- අර්ධ වශයෙන් සිදු කර ඇති ක්‍රියාකාරකම්/ව්‍යාපෘති නිම නොකර ආරක්ෂිත පියවර හා විධිවිධාන යොදා ගනිමින් නතර කිරීමට ඇති අවකාශය මෙන් ම ආර්ථිකය යථා තත්ත්වයට පත්වෙන තුරු මහජනතාවට අවහිරතාවක් ඇතිනොවන පරිදි අවම පිරිවැයක් යටතේ පවත්වාගෙන යාමට ඇති හැකියාව.
- ව්‍යාපෘති සඳහා ණය අරමුදල් සැපයීම සම්බන්ධව වර්තමාන තත්ත්වය හා ණය කොන්දේසි.
- මෙතෙක් දරා ඇති ආයෝජන වටිනාකම,ඉදිරි අක්මුදල් අවශ්‍යතාවය සහ ලබාදිය යුතු ප්‍රතිපාර්ශවීය අරමුදල් ප්‍රමාණය.
- ඉදිරි ක්‍රියාකාරකම්වලට අවශ්‍ය ඉන්ධනඇතුළු ආනයනික අමුද්‍රව්‍ය අවශ්‍යතාවය සහ සැපයුම් සීමාවන්.
- විදේශ විනිමය අවශ්‍යවන කොන්ත්‍රාත් බැඳීම් සහ දේශීය කොන්ත්‍රාත් ගැටළු.
- තෙවන පාර්ශවීය එකඟතාවයන් හා බැදුණු ගැටළු.

2.2 ක්ෂේත්‍ර අධීක්ෂණ

1. අධ්‍යාපන හා සෞඛ්‍ය අංශය



සෞඛ්‍ය පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - ගලෙන්බිඳුණුවැව



ප්‍රාථමික සත්කාර ආයතන - අඹගස්වැව

2. ජලසම්පාදන සහ විදුලිබල අංශය



ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - ගලිගමුව නාගරික ජල සම්පාදන යෝජනා ක්‍රමය



යාපනය කිලිනොච්චි ජල සම්පාදන සහ සනීපාරක්ෂක ව්‍යාපෘතිය

3. ප්‍රවාහන හා මහාමාර්ග අංශය



දුම්රිය කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය - දුම්රිය ටෙලිකොම් පද්ධතිය ස්ථාපනය කිරීම



වරාය ප්‍රවේශ උස් අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු සිදුකරමින්

4. කෘෂිකර්ම හා වාරිමාර්ග අංශය



මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - වෑමැඩිල්ල වම් ඉවුර ප්‍රධාන ඇල



මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - වයඹ පළාත් ඇල ව්‍යාපෘතිය

5. නාගරික පළාත් හා ප්‍රාදේශීය සංවර්ධන අංශය



මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය



ප්‍රවාහන සම්බන්ධතා හා වත්කම් කළමණාකරණ ව්‍යාපෘතිය

2.3 විශේෂ රැස්වීම් සහ සාකච්ඡා පැවැත්වීම

නව මූල්‍ය ප්‍රභවයන්, ව්‍යුහාත්මක කරුණු, සවිස්තරාත්මක සංවර්ධන විකල්ප යෝජනා සහ නව ව්‍යාපෘති ප්‍රවේශයන් හි පවතින ව්‍යාපෘති ගැටළු සමාලෝචනය කිරීම සඳහා මෙන්ම ව්‍යාපෘති කඩිනම් කිරීම තුළින් රාජ්‍ය ආයෝජනයන්හි අපේක්ෂිත ප්‍රතිඵල කාලීනව ජනනය වූ බවට තහවුරු කර ගැනීමේ ද අරමුණු ඇතිව දෙපාර්තමේන්තුව විසින් රේඛීය අමාත්‍යාංශ නිලධාරීන්, ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන්, කොන්ත්‍රාත්කරුවන්, සංවර්ධන පාර්ශවකරුවන් සහ මුදල් අමාත්‍යාංශයේ අනෙකුත් දෙපාර්තමේන්තුවල නියෝජිතයින්ගේද සහභාගීත්වයෙන් විශේෂ රැස්වීම් සහ සාකච්ඡා පවත්වනු ලබයි. තවද, 2022 වර්ෂය සමස්තයක් ලෙස සලකා බැලීමේදී රට තුළ පැවති අර්බුදකාරී ආර්ථික තත්ත්වය හමුවේ පැනනැගි ප්‍රවාහන අපහසුතායවයන් හේතුවෙන් රැස්වීම් සඳහා සහභාගිත්වය ගැටළුකාරී වූ හෙයින් බොහොමයක් රැස්වීම් / සාකච්ඡා මාර්ගගත ක්‍රමය ඔස්සේ පවත්වනු ලැබිණි.

වගුව 2.2 : ප්‍රගතිය ක්ෂේත්‍ර චාරිකා මගින් අධීක්ෂණය (2022.01.01 සිට 2022.12.31 දින දක්වා)			
අංශය/ ක්ෂේත්‍රය	ක්ෂේත්‍ර අධීක්ෂණය සඳහා සැලසුම් කළ ව්‍යාපෘති සංඛ්‍යාව	ක්ෂේත්‍ර අධීක්ෂණය සිදු කළ ව්‍යාපෘති සංඛ්‍යාව	අදාල ආයතන වෙත යොමුකරන ලද අධීක්ෂණ වාර්තා සංඛ්‍යාව
ජලසම්පාදන සහ විදුලි බල	62	2	2
කෘෂිකර්ම හා වාරිමාර්ග	41	1	1
අධ්‍යාපන හා සෞඛ්‍ය	58	19	3
ප්‍රවාහන හා මහාමාර්ග	24	3	3
ප්‍රාදේශීය, පළාත් සංවර්ධන හා රාජ්‍ය පරිපාලනය	37	4	4
මුදල් හා කර්මාන්ත	35	1	1
මුළු එකතුව	**257**	**30**	**14**

ඒ අනුව, මෙම දෙපාර්තමේන්තුව මගින් අනෙකුත් ආයතන වල නිලධාරීන්ගේද සහභාගීත්වයෙන් යුක්තව විශේෂ රැස්වීම් සහ සාකච්ඡා 39 ක් සිදු කළ අතර, එමගින් සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කිරීමේ මූලික කටයුතු, ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීම්, ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීම සහ අන්තර්-ආයතන ගැටලු විසඳීම යනාදී කටයුතු විධිමත් කිරීමට සහ කාර්යක්ෂමව සිදු කිරීමට අවශ්‍ය අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීම තුළින් අඛණ්ඩව පහසුකම් සපයන ලදී.

වගුව 2.3 : සාකච්ඡා සහ විශේෂ රැස්වීම් පැවැත්වීමේ ප්‍රගතිය (2022.01.01 සිට 2022.12.31 දින දක්වා)	
රැස්වීම් / සාකච්ඡා වර්ගීකරණය	සංඛ්‍යාව
ව්‍යාපෘති ගැටළු පිළිබඳව රේඛීය අමාත්‍යාංශ, ව්‍යාපෘති කළමනාකරණ ඒකක හා මෙම දෙපාර්තමේන්තුව සමඟ පැවති විශේෂ රැස්වීම්	21
විශාල හා මහා පරිමාණ ව්‍යාපෘති කඩිනම් කිරීමේ කමිටු (RAMP) රැස්වීම්	16
ආධාර සපයන්නන්ගේ සමාලෝචන රැස්වීම්	04
ප්‍රගති සමාලෝචන රැස්වීම්	55
ආංශික රැස්වීම්	16
සංවර්ධන පාර්ශවකරුවන් සමඟ රැස්වීම්	27
ව්‍යාපෘති මෙහෙයුම් කමිටු / ව්‍යාපෘති සම්බන්ධීකරණ කමිටු රැස්වීම්	44
වෙනත් විශේෂ රැස්වීම් / සාකච්ඡා	51
එකතුව	**234**

2022.09.05 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පත් කරන ලද මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණය සහ කඩිනම් කිරීමේ නිළධාරී කමිටුව (RAMP) විසින් 2022 සැප්තැම්බර් මස සිට මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති 261 ක් සියළුම පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් සමාලෝචනය කරන ලදී. එහිදී, පවතින අර්බුදකාරී ආර්ථික තත්ත්වය තුළ මතුවිය හැකි දුෂ්කරතාවයන් සැලකිල්ලට ගනිමින් නිර්ණායකයන් මත පදනම්ව එම ව්‍යාපෘතිවල ඉදිරි ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් සාමූහික තීරණයන්ට එලඹෙන ලදී. කමිටුව විසින් ගනු ලැබූ තීරණ ඒ ඒ අමාත්‍යාංශ ලේකම්වරු වෙත දන්වා යවා ඇති අතර, ඒවායෙහි ක්‍රියාත්මකවීම පිළිබඳව පසුවිපරම් සිදු කෙරෙමින් පවතී.

එසේම, ඇතැම් මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති කාල දිගු ලබා ගනු ලැබුවද අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීමට අපොහොසත් වන අවස්ථා පවතින බැවින් උද්ගත වී ඇති ගැටළු නිරාකරණය සම්බන්ධයෙන් උපාය මාර්ගික තීරණ ගැනීමට හා කඩිනමින් ප්‍රතිචාර දැක්වීමට හැකි ස්ථාවර ක්‍රමවේදයක අවශ්‍යතාවයද නිරීක්ෂණය විය. ඒ අනුව, 2022.12.05 දින පැවති අමාත්‍ය මණ්ඩලය රැස්වීමේ දී ගත් තීරණයක් අනුව ජාතික මෙහෙයුම් මැදිරියක් (NOR) ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපිත කිරීමට තීරණය කර ඇත. මෙම ජාතික මෙහෙයුම් මැදිරිය වෙත ඉදිරිපත් කෙරෙන ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් නිළධාරීන් 11 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් ද ස්ථාපිත කර ඇති අතර මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණය සහ කඩිනම් කිරීමේ නිළධාරී කමිටුවේ කාර්යභාරය ඉදිරියේ දී මෙම ජාතික මෙහෙයුම් මැදිරිය මගින් සිදු කිරීමට නියමිතය.

2.4 සංවර්ධන පාර්ශවකරුවන් වෙත පහසුකම් සැලසීම

සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මකකරණයේදී සංවර්ධන පාර්ශවකරුවන්ගේ පහසුකම් සලසන්නකුගේ කර්තව්‍යය ද මෙම දෙපාර්තමේන්තුවේ වාර්ෂික වැඩසටහන තුළ ඇති ප්‍රධාන අංගයක් වේ. සංවර්ධන පාර්ශවකරුවන් හයදෙනෙකු සමඟ වාර්ෂිකව සිදුකරන සමාලෝචන ක්‍රියාවලිය මඟින්ද ව්‍යාපෘති කඩිනම් කිරීම තුළින් අපේක්ෂිත සංවර්ධන ප්‍රතිඵල කාලීනව අත්කර ගැනීම තහවුරු කෙරේ.

ඒ අනුව, 2022 වර්ෂයේ ආසියානු සංවර්ධන (ADB) හා ලෝක බැංකු (WB) ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති 50 ක ප්‍රගති සමාලෝචනයන් සිදුකරන ලදී. එමගින් ව්‍යාපෘතිවල පවතින අභියෝගාත්මක ප්‍රශ්න අදාළ බලධාරීන්ගේ අවධානයට යොමු කිරීම මගින් ඵලදායී ව්‍යාපෘති කළමනාකරණයක් සඳහා දායකවී ඇත. සමකාලීනව උද්ගත වූ ආර්ථික අර්බුදය හමුවේ ඇතිවූ සංකීර්ණ ගැටළු හෙත්තුවෙන් සැලසුම් කළ පරිදි අනෙකුත් සංවර්ධන පාර්ශවකරුවන් සමඟ සංවර්ධන ව්‍යාපෘති සමාලෝචනයන් පැවැත්වීමට නොහැකි විය.

2.5 ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ රාමුව සැකසීමේ ප්‍රගතිය

විවිධ ආයතන නියෝජනය කළ ඉහළ රාජ්‍ය නිලධාරීන්ගේ මැදිහත්වීම තුල ඇගයීම් ප්‍රතිපත්තිය සකස්කිරීම පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුවක් පත්කර එහි මඟපෙන්වීම හා සහාය මත මෙම දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂයේදී ජාතික ඇගයුම් ප්‍රතිපත්තිය සකස් කර ගරු අග්‍රාමාත්‍ය තුමාගේ ප්‍රධානත්වයෙන් එළි දක්වන ලදි.

කෙසේ වුවද, මෙම ජාතික ඇගයුම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශයන්, ප්‍රමිතීන්, ඇගයීම් ආචාරධර්ම ආයතනික ව්‍යුහයන්, ඇගයීම් න්‍යාය පත්‍ර, විධික්‍රම උපායමාර්ගික

ප්‍රවේශයන් ඇතුලත් කර ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ රාමුව සකස් කිරීම අමාත්‍ය මණ්ඩල නියෝගයක් මත ආරම්භ කරන ලදී. ඉහත මෙහෙයුම් කමිටුවේ නිර්දේශය මත දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් ජාතික ඇගයීම් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ රාමුවේ ඉංග්‍රීසි මාධ්‍ය පිටපත කෙටුම්පත් කර අවසන් කරන ලද අතර, මේවන විට සිංහල සහ දෙමළ මාධ්‍යයන්ට ද පරිවර්තනය කර ඇති අතර මුද්‍රණයකර එළිදැක්වීමේ කටයුතු නිමකළ යුතුව ඇත.

2.6 සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් වල ප්‍රගතිය ප්‍රකාශයට පත් කිරීම.

සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් වල කාර්යසාධනය පිළිබඳ ප්‍රගති වාර්තාවන් මෙම දෙපාර්තමේන්තුවේ නිර්දේශ සහිතව අමාත්‍ය මණ්ඩලය වෙත කාර්තුමය වශයෙන් ඉදිරිපත් කරන ලදී. ඒ සමඟ අමාත්‍ය මණ්ඩලය ලබාදුන් තීරණ සමඟින් සෑම කාර්තුවක් අවසානයේදීම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත සිය අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘතීන් පිළිබඳ මෙම දෙපාර්තමේන්තුවේ ඇගයීම් හා නිරීක්ෂණ දැනුම් දීමට කටයුතු කර ඇත.

රාජ්‍ය වියදම් සහ සම්පත් වල කාර්යක්ෂම හා ඵලදායී උපයෝජනය පිළිබඳ තොරතුරු මහජනයාට, සිවිල් සංවිධාන සහ අනෙකුත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට පහසුවෙන් ලබාගත හැකිවන පරිදි අදාළ ප්‍රගති වාර්තා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ වෙබ් අඩවියේ (www.treasury.gov.lk) ප්‍රකාශයට පත්කර ඇත.

3 පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 අයවැය තොරතුරු

2022 වර්ෂය සඳහා අනුමත වූ වියදම් ඇස්තමේන්තුව සහ 2022 වර්ෂය සඳහා වියදම් ප්‍රස්ථාර අංක 01 සහ වගුව අංක 3.1 මඟින් ඉදිරිපත් කෙරේ.

වගුව 3.1 : අයවැය තොරතුරු (2022.12.31 දිනට)
ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් - (රු.මි.)

කාණ්ඩය	ඇස්තමේන්තුගත වියදම	සත්‍ය වියදම
පුනරාවර්තන වියදම්	89	82.59
ප්‍රාග්ධන වියදම්	38.5	0.2
මුළු එකතුව	127.5	82.79

ප්‍රස්ථාර අංක 3.1 : අයවැය තොරතුරු - 2022.12.31 දිනට



3.2 වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය



ඒකීය-රුපි

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය තත්ත්වයෙන්ගත ප්‍රකාශය

අවුරුදු 2022 රු.		සටහන	සහල 2022 රු.	2021 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	පෙරිය හංඩව හා සේවා මත බදු	2	-	-	ඒකීය-1
-	ජාතසන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	සංඝවිසෙයක් අලුම්		91,801,000	117,219,000	ඒකීය-3
-	පැන්වල		58,240	740,202	ඒකීය-4
-	අත්තිකාරම් මිලදී		8,294,955	6,218,320	ඒකීය-5
	වෙනත් ගුරුතර ලෙස මිලදී ලැබීම්		-	3,610,574	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		100,154,195	127,788,096	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		100,154,195	127,788,096	
	සංඝවිසෙයවට අදාළ (ඇ)		12,532,054	13,650,704	
	ඉදිරි ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඈ = (ඇ)-(ආ)		87,622,141	114,137,392	
	අඩු කළා : වියදම්				
-	ප්‍රගාමවර්ධනය වියදම්				
69,000,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	63,547,021	60,687,762	
19,500,000	අනෙකුත් සංඝවිට සහ සේවා	6	18,648,737	27,524,279	ඒකීය-2(ii)
500,000	පහසුකම්, ගුදාම සහ මිලදීගැනීම්	7	394,142	490,082	
-	සොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් ප්‍රගාමවර්ධනය වියදම්	9	-	-	
89,000,000	මුළු ප්‍රගාමවර්ධනය වියදම් (ඉ)		82,589,900	88,702,123	
	මූලධන වියදම්				
-	මූලධන වත්කම් ප්‍රගාමවර්ධනය හා පැවිදිලෙස කිරීම්	10	-	-	
38,250,000	මූලධන වත්කම් අත්තෙන් කර ගැනීම්	11	102,680	211,377	
-	ප්‍රගාමන මිලදීගැනීම්	12	-	-	ඒකීය-2(i)
-	මූලය වත්කම් අත්තෙන් කර ගැනීම්	13	-	-	
250,000	ගැසීයා වර්ධනය	14	93,000	148,000	
-	වෙනත් මූලධන වියදම්	15	-	17,574,566	
38,500,000	මුළු මූලධන වියදම් (උ)		195,680	17,933,943	
	ඇත්තෙන් ගෙවීම්		58,240	65,008	ඒකීය-4
	අත්තිකාරම් ගෙවීම්		5,118,751	8,007,519	ඒකීය-5
	වෙනත් ගුරුතර ලෙස මිලදී ගෙවීම්		-	-	
	ගුරුතර ලෙස වියදම් (ඌ)		5,176,991	8,072,527	
	මුළු වියදම් ඊ = (ඉ+උ+ඌ)		87,962,570	114,708,593	
-	දෙසැම්බර් 31 දිනට හේතිය ඒ = (ඉ-ඊ)		(340,429)	(571,201)	
	අදළ හැඳෙදි ප්‍රකාශය අනුව හේතිය		(340,429)	(571,201)	ඒකීය-7
	දෙසැම්බර් 31 දිනට අදිම හේතිය		-	-	ඒකීය-3

1

3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය



ඒඑස්-8

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	සමාගම 2022 රු.	2021 රු.
මූල්‍ය සහනාධාර වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒඑස්-6	70,249,391	84,310,896
මූල්‍ය වත්කම්			
අත්කිසෙවම් බිඳුම්	ඒඑස්-5/5(ඒ)	9,279,250	12,455,454
මිලදී ගැ මිලදී ගමන ලැ	ඒඑස්-3	-	-
මුළු වත්කම්		**79,528,641**	**96,766,350**
කුඩා වත්කම් / බැරකම්			
සංස්ථාගතය සටහ කුඩා වත්කම්		9,279,250	11,779,260
දේපළ පිරියත හා උපකරණ සංවිතය		70,249,391	84,310,896
කුඩා හා වැඩ අත්කිසෙවම් සංවිතය	**ඒඑස්-5(බී)**		
ආදාම වගකීම්			
සැන්දෑ බිඳුම්	ඒඑස්-4	-	676,194
අනුපි ගෙවිය	ඒඑස්-3	-	-
මුළු වගකීම්		**79,528,641**	**96,766,350**

පිටු අංක 01 සිට 33 දක්වා ඒඑස් 1 සිට ඒඑස් 7 දක්වා ද අඩංගු පදනම්ගත් ඉඩ්ටියන් සහගත බිඳුම් සොයාදෑ සහ සටහන් පිටු අංක 34 සිට 41 දක්වා ඇතුළත් බිඳුම් සටහන් සහිතව ද මෙම අවසන් බිඳුම්කරණ අත්තරවාය සොයන් මේ. මෙම මූල්‍ය ප්‍රකාශනය සිදුකළ සිටම පොදුවේ සිදුවන් බිඳුම් මූල්‍යවර්ෂයට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයේ සටහන් මගින් පෙළඹවිට කර ඇති පරිදි සටහන් සුදුසු බිඳුම්කරණ ප්‍රමාණවත් සාධක කර ඇත. ඉහත අවසන් බිඳුම්කරණ සඳහන් සංඛ්‍යා, ඊට අදාළ බිඳුම් සටහන් හා අනෙකුත් බිඳුම් සොයාදෑ සංස්ථාගතය බිඳුම් සොයන් මගින ගැඹුරින් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමි.

මූල්‍ය සාලනය සඳහා වලදායී අභ්‍යන්තර සාලන පද්ධතියක් පවත්වාගෙන යෑමට සහ එය පවත්වා ගැනීම සඳහා අභ්‍යන්තර සාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති වලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට පවත් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමි.

ප්‍රධාන නිලධාරීගේ නිල්පාඩි
නම :
තනතුර :
දිනය : 28/12/2023

කණ්ඩායම් නිල්පාඩි
නම :
තනතුර :
දිනය : 28.12.2023

ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන කණ්ඩායම්/
අධ්‍යක්ෂ (මූල්‍ය)/ කොම්පැනි (මූල්‍ය)
නම : 2023.12.28
දිනය :

අධ්‍යක්ෂ ද බල්ලා
අධ්‍යක්ෂ සභාව

සේ. පිරිසිදුයි
අධ්‍යක්ෂ

සේ.එම්.එම්. සිරිවර්ධන
මූල්‍ය සේවාවන් සහ මූල්‍ය ආයෝජන අධ්‍යක්ෂක සහ
ජ්‍යෙෂ්ඨ ප්‍රධාන විධායක නිලධාරී
මූල්‍ය අමාත්‍යාංශය
කොළඹ 01.

3.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය



ඡේදය-ඊ

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2022 රු.	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
බදු ගැනී ලාභය	-	-
ගණ්ඩු, පරිහාණ, දුර්වලතාව සඳහා වෙන්කිරීම	-	-
ලාභ	-	-
වෙනත් සහයෝග ලාභය	-	-
වෙනත් ආදායම් හිමිය වස්තුවලින් එකතු කරන ලද පොළිය	3,774,815	3,610,574
අලිය ලාභය	91,801,000	117,219,000
සේවිකාවන්ගේ ප්‍රයෝජන ගැනීම	6,763,940	3,192,882
තැන්පතු ලාභය	58,240	740,202
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**102,397,995**	**124,762,658**
අඩුකරන: මුදල් වියැකී යෑම		
ප්‍රවාහල තබාගැනීම් සහ මෙහෙයුම් වියදම්	82,157,438	88,205,541
සහනාධාර සහ වැඩසටහන්	394,142	490,082
වෙනත් වැය කිරීම් සඳහා වස්තුවලින් ලබා ලද වියදම්	1,941,691	280,000
කාර්මිකශාලාව වියවන ලද අලිය	12,532,054	13,650,704
සේවිකාවන්ගේ වැටුප්	5,118,751	4,137,380
තැන්පතු ගෙවීම්	58,240	65,008
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (අ1)	**102,202,315**	**106,828,715**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (අ2)=(අ)-(අ1)	**195,680**	**17,933,943**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
නිවාහක වුවමනාවන් ප්‍රතිසාධන සහ සෙසුම් වියදම් වියකීම්	-	-
උපකරණ අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ1)	-	-
අඩුකරන: මුදල් වියැකී යෑම		
සෙසුම් වියදම් ඉදිකිරීම් සහ මිලදී ගැනීම් සහ වෙනත් ආයෝජන අත්කර ගැනීම්	195,680	17,933,943
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (අ)	**195,680**	**17,933,943**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(අ2)-(අ)	**(195,680)**	**(17,933,943)**
මෙහෙයුම් සහ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(අ2) + (ඊ)	**(0)**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (උ1)	-	-
අඩුකරන: මුදල් වියැකී යෑම		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (අ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඊ)=(උ1)-(අ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඊ)	-	-
සහතික 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්



වාර්තාකිරීමේ පදනම

1) **වාර්තාකරණ කාලපරිච්ඡේදය**

2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) **මිනුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) **ආදායම් හඳුනාගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) **දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) **දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) **මුදල් හා මුදල් සමාන දෑ**

2022 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

7) **මූල්‍ය ප්‍රකාශන ආකෘතියෙහි සිදුකරන ලද වෙනස්කම් හා පෙර වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ගැලපීම.**

2022 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ආකෘතිවල සිදුකරන ලද වෙනස්කම් අනුව 2021 වසර සඳහා වන සංසන්දනාත්මක සංඛ්‍යාවල අදාළ ගැලපුම් සිදුකර ඇත.

6

3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

මෙම දෙපාර්තමේන්තුව ආදායම් එකතු කිරීමේ දෙපාර්තමේන්තුවක් නොවේ.

වගු අංක 3.2 : ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. '000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
මෙම දෙපාර්තමේන්තුව ආදායම් එකතු කිරීමේ දෙපාර්තමේන්තුවක් නොවේ.					

3.7 ප්‍රතිපාදන උපයෝජන කිරීමේ කාර්ය සාධනය

වගු අංක 3.3 : ප්‍රතිපාදන උපයෝජන කිරීමේ කාර්ය සාධනය

රු. '000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		සත්‍ය වියදම	උපයෝජනය, අවසාන ප්‍රතිපාදනයෙහි % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	89,000,000	89,000,000	82,589,900	92.80
ප්‍රාග්ධන	38,500,000	38,500,000	195,680	0.51

3.8 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

වගු අංක 3.4 : වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. '000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		සත්‍ය වියදම	උපයෝජන කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබාදුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01	රාජ්‍යසේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	සංවර්ධන නිලධාරි වැටුප්	2,363,440	2,363,440	1,941,691	82%

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වගු අංක 3.5 : මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. '000

වත්කම් ක්ෂේත්‍රය	ක්ෂේත්‍ර විස්තරය	31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2022 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	-	-	
9152	යන්ත්‍රෝපකරණ	70,249,390.52	70,249,390.52	-	100%
9153	ඉඩම්	-	-	-	
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	

3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව

** ** පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ දී, විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව පරිලෝකනය (SCAN) කොට මෙහි අන්තර් ගත කර ඇත.

4 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශකය

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

වගුව 4.1 : ආයතනයේ කාර්යසාධන දර්ශක (2022.12.31 දිනට)			
විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුම්		
	100%- 90%	75% -89%	50%-77%
ප්‍රගති සමාලෝචනය සිදුකරන ලද වැඩසටහන් සහ ව්‍යාපෘති සංඛ්‍යාව	√		
තීරණ ගැනීම පිණිස කාලීනව නිකුත් කරන ලද ප්‍රගති සමාලෝචන වාර්තා සංඛ්‍යාව	√		
ගැටළු නිරාකරණය කිරීම සඳහා විදේශීය මූල්‍යනය සපයන ආයතන සමග පවත්වන ලද ප්‍රගති සමාලෝචන රැස්වීම් සංඛ්‍යාව			√
නිරතවූ ක්ෂේත්‍ර චාරිකා සහ හඳුනාගත් ගැටළු සංඛ්‍යාව			√
ජාතික ඇගයීමේ ප්‍රතිපත්ති රාමුව සැකසීමේ මට්ටම/තත්වය	√		
තෝරාගත් ව්‍යාපෘතියක් ඇගයීමේ ක්‍රියාවලියේ නිරතවීමේ මට්ටම/තත්වය	මෙම ක්‍රියාකාරකම 2022 වසරේ පැනනැගි ආර්ථික අර්බුදය හමුවේ ඇතිවූ ප්‍රවාහන අපහසුතාවයන් මත ක්‍රියාත්මක නොකිරීමට තීරණය කරන ලදී.		
කාර්ය මණ්ඩල හැකියාව සහ නිපුණතාව වර්ධනය කිරීම සඳහා යොමු කෙරුණු පුහුණු වැඩසටහන් සංඛ්‍යාව			√

5 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

තිරසාර සංවර්ධන අරමුණ ළඟා කර ගැනීම සඳහා රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතීන් හා වැඩසටහන්වල අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීමේ ප්‍රගතීන් අධීක්ෂණය හා ඇගයීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් කළ යුතු කාර්යභාරය වගු අංක 5.1 හි දක්වා ඇත.

වගු අංක: 5.1 : තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය					
ඉලක්කය/ අරමුණ	**ඉලක්ක**	**ජයග්‍රහණ දර්ශක**	**මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය**		
			0% - 49%	**50%- 74%**	**75%- 100 %**
16	16.6 16.7 16.8 16.10	1. වෙබ් පාදක ජාතික සංවර්ධන තොරතුරු පද්ධතිය සඳහා ප්‍රවේශ වූ පාර්ශවකරුවන් ගණන	ජාතික සංවර්ධන තොරතුරු පද්ධතිය සැකසුම් මට්ටමේ පවතී.		
		2. වෙබ් පාදක ජාතික සංවර්ධන තොරතුරු පද්ධති ප්‍රවේශයට සිදු වූ අවහිරතා පිළිබඳ වාර්තාවීම්			
		3. ඇගයීම් අනාවරණයන් සඳහා පහසු ප්‍රවේශය	√		
		4. වෙබ් පාදක ජාතික සංවර්ධන තොරතුරු පද්ධතියට නියමිත අවස්ථාවේදී ප්‍රවේශයවීමට සිදු වූ අවහිරතා පිළිබඳ වාර්තාවීම්	තොරතුරු පද්ධතිය සැකසුම් මට්ටමේ පවතී.		
		5. සංවර්ධන පාර්ශවකරුවන් සමඟ පැවැත්වූ ඒකාබද්ධ ව්‍යාපෘති සමාලෝචන සංඛ්‍යාව	√		
		6. සංවර්ධන පාර්ශවකරුවන් සතු තොරතුරු සඳහා ප්‍රවේශය	√		
17	17.8 17.16 17.17	1.සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් හුවමාරු වූ දත්ත පවත්වා ගැනීම			√
		2. හොඳම භාවිතයන් (ව්‍යාපෘති) පිළිබඳ තොරතුරු පවත්වාගෙන යාම			√

6 පරිච්ඡේදය- මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු

2022.12.31 දිනට දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත පරිදි විය.

වගුව 6.1 : කාර්යමණ්ඩල තොරතුරු (2022.12.31 දිනට)

කාර්ය මණ්ඩල වර්ගීකරණය	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සේවක සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ ශ්‍රේණියේ නිලධාරීන්	31	23	8
තෘතීය මට්ටමේ නිලධාරීන්	4	-	4
ද්විතීය මට්ටමේ නිලධාරීන්	47	34	13
ප්‍රාථමික මට්ටමේ නිලධාරීන්	20	15	5
එකතුව	**102**	**72**	**30**

6.2 කාර්ය මණ්ඩල පුරප්පාඩු

දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 102 කින් සමන්විත විය යුතු වුවද, 2022.12.31 දිනට තත්‍ය කාර්ය මණ්ඩලය නිලධාරීන් 72 කින් පමණක් සමන්විත විය. ඒ අනුව පැවති පුරප්පාඩු සංඛ්‍යාව 30 කි. පුරප්පාඩු වී ඇති ජ්‍යෙෂ්ඨ නිලධාරීන් අටදෙනෙකු අතුරින් තිදෙනෙකු ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයට අයත් වන අතර, ඔවුන් අතුරින් දෙදෙනෙකු අධ්‍යක්ෂ කාණ්ඩයටත්, එක් අයෙකු නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ කාණ්ඩයටත් අයත්වේ. මෙම තනතුරු 03 පුරප්පාඩු වී පැවතීම දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනයට බලවත් සේ බලපා ඇති අතර, අනෙකුත් සේවා වල පැවති පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර ඇත.

ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ ජ්‍යෙෂ්ඨ ශ්‍රේණියේ නිලධාරීන් හැරුණු කොට අනෙකුත් සේවාවන්හි ජ්‍යෙෂ්ඨ ශ්‍රේණියේ නිලධාරීන්ද මෙම දෙපාර්තමේන්තුවෙහි ව්‍යාපෘති කළමනාකරණය සහ අධීක්ෂණ කාර්යයන්හි නිරත වීමේ අවස්ථාව ලැබීම නවමු අත්දැකීමක් වී ඇත.

තවද ද්විතියික සේවක කාණ්ඩය යටතට ගැනෙන සංවර්ධන නිලධාරී පුරප්පාඩු 11 ක් පවතින නමුත්, දෙපාර්තමේන්තුව සඳහා ප්‍රමාණවත් ඉඩකඩ නොමැති වීම ඉහත පුරප්පාඩු පිරවීම සඳහා බාධාවක් වී ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

වගුව 6.2 : සේවක පුහුණු විස්තර (2022.12.31 දිනට)

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව (දින)	සමස්ත අයෝජනය (රු.මි)		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමවුම් / ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
වෘත්තීකයන් සඳහා ඉංග්‍රීසි ඩිප්ලෝමාව	1	2022.10.08 – 2023.08.05	75,000		දේශීය	**
රජයේ වැටුප් සකස් කිරීමේ මෘදුකාංගය පිළිබඳ පුහුණුව	1	2022.10.12 – 2022.10.14	18,000		දේශීය	**
සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා රජයේ ඵලදායීතාවය හා කාර්යක්ෂමතාවය පිළිබඳ සම්මන්ත්‍රණය	4	2022.06.08 / 2022.06.28	-		විදේශීය (මාර්ග ගත ක්‍රමය හරහා)	**
ඇගයීම් කළමනාකරණය පිළිබඳ වැඩමුළුව	2	2022.09.26 / 2022.09.30	-		දේශීය	**
ආයතන සංග්‍රහයේ විධිවිධාන පිළිබඳ දැනුවත්කිරීමේ වැඩසටහන	2	2022.09.18 / 2022.09.29 සහ 2022.10.27 / 2022.10.28	-		දේශීය	**
ප්‍රථිපල ඉලක්ක කරගත් සංවර්ධන කළමනාකරණය සහ ව්‍යාපෘති සත්‍යාපනය කිරීමේ වැඩමුළුව	32	2022.12.02 – 2022.12.04 සහ 2022.12.20 – 2022.12.21	-		දේශීය	**

** දේශීයව ක්‍රියාත්මක කෙරෙන පුහුණු හා වැඩසටහන් මගින් රාජ්‍ය නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය වීමක් සිදුවන අතර, එමගින් දෛනික රාජකාරීන් සඳහා එම දැනුම හා හැකියාවන් අන්තර්ග්‍රහණය කිරීමට හැකිවේ.

7 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

වගුව 7.1 : අනුකූලතා වාර්තාව (2022.12.31 දිනට)

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූලයි		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්	අනුකූලයි		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	–		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්			
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්			
1.6	වෙනත්			
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලයි		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වා ගෙනයාම	අනුකූලයි		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලයි		
2.4	අභ්‍යන්තර විගණන වර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලයි		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූලයි		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලයි		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලයි		

2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලයි		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලයි		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලයි		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලයි		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ . 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූලයි		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූලයි		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවත් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූලයි		
3.4	2014.05.11 දිනැති අංක 171/2001 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූලයි		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූලයි		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූලයි		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූලයි		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේ න්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූලයි		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූලයි		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූලයි		

6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූලයි		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තා වකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූලයි		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූලයි		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර් තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූලයි		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූලයි	මුදල් ආර්ථික ස්ථායීකරන හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මගින් පවත්වනු ලැබේ.	
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කලමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව , වත්කම් මිල දී ගැනීම් හා අපහරණ කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලයි		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව , එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූලයි		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලයි		

8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූලයි		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූලයි		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූලයි		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අදාල නොවේ.		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලයි		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු. රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූලයි		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූලයි		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම ,	අදාල නොවේ.		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූලයි		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූලයි		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූලයි		

11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූලයි		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූලයි		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම	අනුකූලයි		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූලයි		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට නැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ.	ණයක් අයකර ගැනීම සඳහා අධිකරණයේ නඩු කටයුත්තක් සිදු වෙමින් පවතී.	
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූලයි		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූලයි		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූලයි		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම , එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූලයි		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූලයි		
14.4	අග්‍රිම ගිණුම් ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූලයි		

15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාල නොවේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම			
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම			
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූලයි		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූලයි		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලයි		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වා ගෙන යාම	අනුකූලයි		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූලයි		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ		ඉල්ලීමක් ලැබී නොමැත
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (I) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ		සකස් කරමින් පවතී

18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි , පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධික්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල නොවේ		සකස් කරමින් පවතී
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූලයි		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම	අනුකූලයි		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූලයි		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම , නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූලයි		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූලයි		

ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව - සංවිධාන ව්‍යුහය 2022.12.31



(09)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } TPD/B/DPMM/02/22/19 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 මැයි 16 වන දින



ගණන්දීමේ නිලධාරී

ව්‍යාපෘති කළමනාකරණ අධීක්ෂණ දෙපාර්තමේන්තුව

ශීර්ෂය 280 - ව්‍යාපෘති කළමනාකරණ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

යටෝක්ත වාර්තාව සහ විගණිත මූල්‍ය ප්‍රකාශන මේ සමග එවමි.

බී.ඕ.ඩී. ප්‍රනාන්දු
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත : (1) අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව - මූල්‍ය ප්‍රකාශනවල මුල් පිටපත හා උක්ත වාර්තාවේ පිටපතක් මේ සමඟ එවා ඇත.

(2) ලේකම් - මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය (කා.දැ.ස)

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. TPD/B/DPMM/02/22/19

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2023 මැයි 16 දින

ගණන්දීමේ නිලධාරී

ව්‍යාපෘති කළමනාකරණ අධීක්ෂණ දෙපාර්තමේන්තුව

ශීර්ෂය 280 - ව්‍යාපෘති කළමනාකරණ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 280 - ව්‍යාපෘති කළමනාකරණ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ව්‍යාපෘති කළමනාකරණ අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථාකාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ව්‍යාපෘති කළමනාකරණ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කළමනාකරණ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.38,250,000 ක් වූ ප්‍රතිපාදනයෙන් එකතුව රු.38,147,320 ක් හෙවත් සියයට 100 ක හා සියයට 99.72 ක පරාසය තුළ උපයෝජනය නොකර ඉතිරි වී තිබුණි.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා යොදා ගන්නා ACA-2(i) උප ආකෘති පත්‍රය

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) වැය විෂය අංක 280-2-1-1302 යන්ත්‍ර හා උපකරණ සඳහා මූලික ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු.200,000 ක් හා මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව රු.450,000 ක් අමතර ප්‍රතිපාදන සලසාගෙන තිබුණ ද, ACA – 2(i) ආකෘති පත්‍රයේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු.300,000 ක් හා මුදල් රෙගුලාසි 66 යටතේ අමතර ප්‍රතිපාදන රු.350,000 ක් ලෙස දක්වා තිබුණි.

(ආ) වැය විෂයය අංක 280-2-1-1409 වෙනත් - සඳහා මූලික ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු.500,000 ක් හා මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව රු.100,000 කින් ප්‍රතිපාදන අඩු කර තිබුණ ද, අදාළ ආකෘති පත්‍රයේ අඩු කරන ලද ප්‍රතිපාදනය නොපෙන්වා අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදනය ලෙස රු.400,000 ක් ලෙස හා වැය විෂය අංක 280-2-1-1403 විදුලිය හා ජලය යටතේ දක්වා තිබුණි.

2.3 නීති රීති රෙගුලාසිවලට අනුකූල නොවීම

2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු මාර්ගෝපදේශයේ ඒසීඒ - 07 ආදර්ශ ආකෘතිය ප්‍රකාරව අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද බැර කිරීම් හා අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතන විසින් අත්තිකාරම් "බී" ගිණුම වෙනුවෙන් කරන ලද හර කිරීම් ලෙස වෙන් වෙන්ව දැක්විය යුතු විය. එහෙත් අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද බැර කිරීම් රු.2,566,717 ක් හා අනෙකුත් ශීර්ෂවලට දෙපාර්තමේන්තුව විසින් අත්තිකාරම් "බී" ගිණුම් කටයුතු වෙනුවෙන් කරන ලද හර කිරීම් රු.1,223,786 ක් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ වෙන් වෙන්ව නොදක්වා අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද බැර කිරීම් යටතේ එකතුවක් ලෙස රු.3,790,119 ක් දක්වා තිබුණු බව නිරීක්ෂණය විය.

2.4 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ස්ථාන මාරු වී ගිය නිලධාරිනියකගෙන් ආපදා ණය හා උත්සව අත්තිකාරම් වශයෙන් එකතුව රු. 232,858 ක් අයවිය යුතුව තිබුණි. 2022 දෙසැම්බර් 31 දින වන විට වසර 02 ක් ඉක්මවා තිබුණ ද, මෙම හිඟ ණය ශේෂ අයවී නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු වසර 7 ක කාලයක් ඉක්මවූ රු.139,921 ක් වූ ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අය වී නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලසුම් කිරීම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2022 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණ ද, චක්‍රලේඛයේ 3(අ) ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය හා දැනට සිටින කාර්ය මණ්ඩලය, සංවිධාන ව්‍යූහය හා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත කර නොතිබුණි.

3.1.2 කාර්යභාරයන් ඉටු කිරීම

අපේක්ෂිත සංවර්ධන ප්‍රතිඵල ජනනය සහතික කරනු වස් සියලුම සංවර්ධන ව්‍යාපෘතීන් අධීක්ෂණය, ඇගයීම සහ පහසුකම් සැලසීම මෙන්ම ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන ආයතන වෙත උපදේශනය ලබා දෙමින් සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම තුළින් එකඟ වූ කාලරාමුව සහ පිරිවැය තුළ අපේක්ෂිත සංවර්ධන ප්‍රතිඵල ජනනය ඉහළ නැංවීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වූ අතර, සියලුම කාර්යයන් ඒ අනුව හඳුනාගෙන තිබුණි. එම කාර්යයන් ඉටු කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කර තිබූ ක්‍රියාකාරකම් 02 ක් සම්බන්ධව කිසිදු ප්‍රගතියක් අත් කරගෙන නොතිබුණු අතර, තවත් ක්‍රියාකාරකම් 03 ක අරමුණු කරා ළඟා වීම සියයට 51 කට වඩා අඩු මට්ටමක පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දේශීය හා විදේශීය මූල්‍යයනය මත විවිධ රේඛීය අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වූ විශාල සහ මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති සංඛ්‍යාව 261 ක් වී තිබූ අතර, එයට විශාල පරිමාණ ව්‍යාපෘති 150 ක් හා මහා පරිමාණ ව්‍යාපෘති 111 ක් අයත් විය.

සමාලෝචිත වර්ෂය අවසන් වන විට නිම කිරීමට නියමිතව තිබූ ව්‍යාපෘති 109 ක් අතුරින් ව්‍යාපෘති 29 ක් පමණක් අවසන් ව්‍යාපෘති ප්‍රතිඵලය ජනනය කිරීමට සමත්ව තිබුණු අතර, කාර්යසාධන ගැටළු හේතුවෙන් මහා පරිමාණ ව්‍යාපෘති 29 ක් වර්ෂ අවසානය වන විට අත්හිටුවා තිබුණු බැවින්, ව්‍යාපෘති කාර්යසාධනය දුර්වල මට්ටමක පැවතුණි. මේ අනුව, සම්පත් ප්‍රශස්ත ලෙස භාවිත කිරීම තුළින් එකඟ වූ කාලරාමුව සහ පිරිවැය තුළ අපේක්ෂිත සංවර්ධන ප්‍රතිඵල ජනනය ඉහළ නැංවීම සඳහා වූ අරමුණ අපේක්ෂිත පරිදි ඉටුවී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) විවිධ ආයතන නියෝජනය කළ ඉහළ රාජ්‍ය නිලධාරීන්ගේ මැදිහත්වීම තුළ ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා මෙහෙයුම් කමිටුවක් පත් කර එහි මගපෙන්වීම හා සහාය මත දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂයේදී ජාතික ඇගයුම් ප්‍රතිපත්තියක් සකස් කර ඇති බව කාර්යසාධන වාර්තාවේ දක්වා තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ජාතික ඇගයුම් ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවා නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටුකර ගැනීමේ අපේක්ෂාවෙන් අදාළ ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා රු.මිලියන 127.5 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණ ද, සමාලෝචිත වර්ෂය තුළ එයින් රු.මිලියන 82.78 ක් හෙවත් සියයට 65 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය වෙතින් විධිමත් පවරාගැනීමකින් තොරව වාහන 02 ක් දෙපාර්තමේන්තුවේ පරිහරණයට ලබාගෙන තිබුණි.

(ආ) මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය වෙත නැවත භාරදිය යුතු බවට තීරණය කර තිබුණු දෙපාර්තමේන්තුව සතු ධාවනයෙන් ඉවත් කරන ලද මෝටර් රථ 02 කට අදාළ ලියවිලි හා තොරතුරු 2020 වර්ෂයේදී අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විධිමත් පරිදි පවරාදීමේ කටයුතු සිදුවී නොතිබුණි.

(ඇ) 2022 වර්ෂයේ අවසාන දිනට අදාළව සිදු කරන ලද වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව දෙපාර්තමේන්තුවේ ඉන්වෙන්ට්‍රි ලේඛනය තුළ ඇතුළත් Laptop පරිගණකය සමඟ බෑගයක ඌනතාවයක් පැවතීම හා ඉන්වෙන්ට්‍රි ලේඛනයේ සඳහන් අයිතමයන් හෞතිකව හඳුනාගැනීමේ නිසි ක්‍රම අංක සඳහන් කර නොතිබීම නිරීක්ෂණය විය. තවද, ඌනතා ලෙස දක්වා තිබුණු රු.244,432 ක් වටිනා Laptop පරිගණකය සමඟ බෑගය සමාලෝචිත වර්ෂයේදී සොරකම් කර තිබුණු බව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ සටහන් (i) මඟින් දක්වා තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අදාළ වටිනාකම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.3 තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය

තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතීන් හා වැඩසටහන්වල අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීමේ ප්‍රගතීන් අධීක්ෂණය හා ඇගයීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන තිබූ කාර්යභාරයන්හි ප්‍රගතිය පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ජාතික සංවර්ධන තොරතුරු පද්ධතිය සැකසුම් මට්ටමේ පවත්නා බැවින් දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන තිබූ තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ ජයග්‍රහණ දර්ශක 03 ක් සම්බන්ධව කිසිදු ප්‍රගතියක් ලබා නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් ඉටු කළ යුතු හා පහසුකම් සැලසිය යුතු තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ ජයග්‍රහණ දර්ශක 03 ක අරමුණු ළඟා වීම සියයට 49 කට වඩා අඩු මට්ටමක පැවතුණි.

4. මානව සම්පත් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සංඛ්‍යාව 102 ක් වූ අතර ඉන් තනතුරු 30 ක් පුරප්පාඩුව පැවතුණි. එම පුරප්පාඩු අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 08 ක්ද, තෘතීයික මට්ටමේ 04 ක් හෙවත් අනුමත ප්‍රමාණයෙන් සියයට 100 ක් හා ද්විතීයික මට්ටමේ තනතුරු 13 ක් ද විය.

බී.ඕ.ඩී. ප්‍රනාන්දු
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට